**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම - 2018**

සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම.**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම විසින් 2017/2018 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23.1(අ) වගන්තිය | සමාගමේ තොරතුරු නිලධරයන් වශයෙන් නිලධරයන් එක් අයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ අභියාචනා විභාග කිරීම සඳහා නම්කළ නිලධාරියෙකු පත්කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 103 (1) ඊ රෙගුලාසිය. | සමාගම විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීමේ හා වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 215,029ක අධිභාර ගෙවීමට සිදුවී තිබූ අතර ඒ සම්බන්ධයෙන් උක්ත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | |

| | |
|---|---|
| (i) 4.2.2 ඡේදය | සමාගමේ කාර්යසාධනය ඇගයීම සහ අවශ්‍ය පාලනයන් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළදී පිළිවෙළින් අවස්ථා 05 කදී හා අවස්ථා 03 කදී පමණක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා තිබුණි. |
| (ii) 9.2 ඡේදය හා 9.3.1 ඡේදය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් සඳහාම අනුමත කාර්ය මණ්ඩලයක් තිබිය යුතු අතර එය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු අතර, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය උක්ත දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාල අමාත්‍යාංශය විසින් අනුමත කිරීම කළ යුතු වුවත් සමාගම විසින් ඒ අනුව කටයුතු කර තිබූ බවට විගණනයට තහවුරු නොවුණි. |
| (ඇ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | තම ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවත් සමාගම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද සමාගමේ බඳවාගැනීමේ පටිපාටිය විධිමත් පරිදි අනුමත කර නොතිබූ අතර එම පටිපාටිය අනුව ව්‍යාපෘති කළමනාකරු (ආපන ශාලා) තනතුරට අදාල අධ්‍යාපන, වෘත්තීය හෝ සේවා පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල පිටපත් එම තනතුරට පත්කර තිබූ නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව තුළ නොතිබුණු අතර එම සහතිකවල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.

එසේම, එම නිලධාරියා වෙත ලිඛිත රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණු අතර ඔහු විසින් පැමිණීමේ ලේඛනයේ හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සටහන් කර නොතිබුණි. ඒ අනුව, පැමිණීම, පිටවීම හා සිදුකළ කාර්යයන් පිළිබඳ තහවුරු කරගැනීමකින් තොරව 2015 ජුනි සිට 2019 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් මාසයකට රු. 32,500 බැගින් රු. 1,690,000 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළදී ආරක්ෂක සේවා අංශයේ ආදායම ප්‍රමාණාත්මක ලෙස අඩුවී තිබූ අතර 2015/2016 ගිණුම් වර්ෂයට සාපේක්ෂව එය පිළිවෙලින් රු. 41,406,545 කින් එනම් සියයට 26 කින් හා රු. 26,496,258 කින් එනම් සියයට 17 කින් අඩුවී තිබුණි. 2015/2016 ගිණුම් වර්ෂය තුළදී ආරක්ෂක සේවා සැපයූ පාරිභෝගිකයන් සංඛ්‍යාව 20 ක් වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම පාරිභෝගිකයන් සංඛ්‍යාව 03 ක් දක්වා අඩුවී තිබීම ඊට ප්‍රධාන හේතුව වී තිබූ අතර ආදායම වර්ධනය කරගැනීමට අලෙවි ප්‍රවර්ධන උපක්‍රම අනුගමනය කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

තවද, 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ආරක්ෂක සේවා ගිවිසුම් අවසන් වී තිබූ ආයතන 06 කින් රු. 7,016,658 ක් ද ගිවිසුම් රහිතව ආරක්ෂක සේවා සපයා තිබූ ආයතන හා පුද්ගලයන්ගෙන් රු. 448,355 ක් ද වශයෙන් එකතුව රු. 7,465,013 ක් 2018 අගෝස්තු 31 දින වන විටද ලැබිය යුතුව තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ජාතික තරුණ සේවා සභාවෙන් සමාගමට ලැබී තිබූ එකතුව රු. 3,710,750 ක් වූ ආහාර ඇනවුම් 06 ක් හා එකතුව රු. 1,476,725 ක් වූ මුද්‍රණ ඇනවුම් 04 ක් සමාගමේ අදාල අංශ විසින් ඉටු කර ගැනීමකින් තොරව බාහිර ආයතනයක් මඟින් ඉටු කරවාගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමකින් තොරව බාහිර ආයතන වෙත එම ඇණවුම ඉදිරිපත් කර තිබුණු අතර ඒ තුළින් ඉතා අඩු ලාභයක් උපයා තිබුණි. ඒ අනුව, සමාගමේ ප්‍රධාන ව්‍යාපාර අංශයන් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ලාභදායීත්වය වර්ධනය කරගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම පිහිටුවීමට අදාල 1982 සැප්තැම්බර් 15 දිනැති අංක 331 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව ජාතික තරුණ සේවා සභාවේ අරමුණක් වූ "රාජ්‍යයේ ආර්ථික සැකසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව දීර්ඝකාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථා සැලසීම" යන අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා තරුණයන්ට ස්වයං රැකියා අවස්ථා සලසාදීමට සහාය වනු පිණිස සීමාසහිත තරුණ සේවා සමාගම පිහිටුවීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව පිහිට වූ සමාගමේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්ගේ ප්‍රමාණාත්මක ආදායමක් නොලැබීම හේතුවෙන් සභාවේ උක්ත අරමුණ ඉටුකර ගැනීම සඳහා සමාගම ආරම්භ කළ අවස්ථාවේ සිට කිසිඳු මූල්‍යමය දායකත්වයක් සභාව වෙත ලබාදීමට නොහැකි වී තිබුණි.

## 3.3 අවිධිමත් ගනුදෙනු

---------------------

සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 68.අ වගන්තිය ප්‍රකාරව සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ ධූරය 2019 මාර්තු 02 සිට 2019 නොවැම්බර් 07 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී පුරප්පාඩුව පැවතියදී එම කාල සීමාව වෙනුවෙන් මාසික දීමනා, ඉන්ධන වියදම් සහ දුරකථන දීමනා වශයෙන් එකතුව රු. 336,740 ක් තනතුර පුරප්පාඩු වූ කාලපරිච්ඡේදයට පෙර කළමනාකරණ අධ්‍යක්ෂ ධූරය දැරූ නිලධරයා වෙත ගෙවා තිබුණි.

**4. තිරසාර සංවර්ධනය**

**තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම.**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජයීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම්කර ගනිමින් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" හඳුන්වා දී ඇති අතර, එය සියළු සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශනයක් වේ. එසේ වුවද, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.